# හාවුන් ඇතිකරමු

හා මස්, ආහාරයක් වශයෙන් ඉතාමත් අනර්ඝය. ඉතා මෘදු ලෙස්, සුදුපැහැති වැඩි මාංශජනක ධාතු හා අඩු මේද ප්‍රමාණයක් අඩංගු, හා මස් දිරවීමට ඉතා පහසු වේ. හා මස් අනෙකුත් මස් සමඟ සසඳන විට, ගුණදායක බව පහත දක්වා ඇති සටහන බැලීමෙන් අවබෝධ වේ.

| | මාංශ ජනක ධාතු | මේද | ලවන |
|---|---|---|---|
| | % | % | % |
| හා මස් | 20.5 | 4 | 1.5 |
| ගව මස් | 18 5 | 18 | 0.9 |
| එළු මස් | 17.0 | 25 | 1.0 |
| ඌරු මස් | 16.0 | 27 | 1.0 |

ගැහැණු සතෙකු, මාස 7-8 වන විට පැටව් දැමීම අරඹයි. වරකට පැටව් 5 7 බැගින් වර්ෂයකට තුන් වතාවක් හෝ හතර වතාවක් පැටව් දමයි. මෙසේ නොකඩවා, වර්ෂ 2-3ක් පැටව් බිහිකරණු ලබයි.

හාවුන් සඳහා ආහාර සැපයීම, වියදම් රහිත බැවින් සහ වර්ෂයක් තුල එක ගැහැණු සතෙකු වැඩි පැටව් ප්‍රමාණයක් බිහිකරනු ලබන බැවිනුත්, වැඩි ලාභ ලබා ගත හැක. පහසුවෙන් ලබා ගත හැකි තෘණ වර්ග, පලා වර්ග, උඳුපියලි, රණිල වර්ග අල වර්ග ආදිය ආහාර සේ සැපයිය හැක. එසේම හාවුන් සඳහා කූඩා නිවාස ඉදි කිරීමට එතරම් මුදලක් වැය නොවේ. හාවුන් ඇති කිරීමේදී ප්‍රධාන ලෙසම මුදල් වැය වන්නේ, බෝ කරන හාවුන් මිළදී ගැනීමට පමණි. මින් පෙනී යන්නේ හාවුන් ඇති කිරීම ලෙහෙසියෙන් පාලනය කල හැකි වඩාත් ලාභ දායක ව්‍යාපාරයක් බවයි.

ශ්‍රී ලංකාව උෂ්ණ කලාපික රටක් වන බැවින්, හාවුන් ඇති කිරීමේදී උෂ්ණත්වය බලපානු ලැබේ. උෂ්ණත්වය 30% වඩා වැඩි වුවහොත්, හාවුන්ගේ වර්ධන වේගය හීනවන අතර වඳ බවක්ද දක්නට ලැබේ. එහෙත් උෂ්ණත්වයේ බලපෑම අඩුකර ගැනීමට ලංකාවේ දක්නට ලැබෙන දේශීය ද්‍රව්‍ය උපයෝගී කරගත හැක. හාවුන්ගේ හම ඇඳුම් ආයිත්තම් නිෂ්පාදනය සඳහා වැඩි මුදලකට විකිනිය හැක. තවද හාවුන් පහකරන මලවල, පොස්පරස් සහ නයිට්‍රජන් වැඩි ප්‍රමාණයක් අඩංගු බැවින් පොහොරක් වශයෙන් ඉතාමත් යෝග්‍ය වේ.

## හාවුන් වර්ග

අප රටේ දේශගුණයට යෝග්‍ය වන්නේ මධ්‍යම ප්‍රමාණයේ සුදු පැහැති, කෙටි ලෝම සහිත හාවුන් වේ.

උදා: නවසීලන්ත සුදු හාවුන් වර්ගය
කැලිපෝනියා වර්ගය

ජනප්‍රියවී ඇති හාවුන් වර්ග කීපයක් නම්:— හිමාලයා වර්ගය, යෝධ ප්ලේමිස් වර්ගය, බෙවන්, චින්චිලා ආදී වර්ගයන්ය.

බෝ කිරීම සඳහා හාවුන් තෝරා ගැනීමේදී හොඳ සෞඛ්‍ය තත්වයක ඇති, දිලිසෙන ලෝම වලින් යුත්, දීප්තිමත් ඇස් ඇති අත් පා හොඳින් ශක්තිමත්ව වැඩී ඇති හාවුන් තෝරාගතත යුතුය. හා පට්ටියේ දියුණුව රඳා පවතින්නේ බෝ කිරීම සඳහා හාවුන් තේරීම සහ බෝකිරීමේ ක්‍රමය අනුවය. හාවුන් ඉතා සීඝ්‍රයෙන් බෝවන බැවිනුත් පරම්පරාව අතර වැඩි කාලපරතරයක් නොමැති බැවින් නෑකම් ඇති හාවුන් මගින් බෝ කිරීම වැලැක්වීම වැදගත් වේ. මස් සඳහා එකිනෙකාට වෙනස් හාවුන් වර්ග දෙකක් පව්ටි දැමීම සුදුසුය.

උදා: යෝධ ප්ලේමිස්/නවසීලන්ත සුදු > සීඝ්‍රයෙන් වැඩෙන දෙමුහුන් පැටව්

නමුත් දෙමුහුන් පැටව් බෝ කිරීම සඳහා නොයොදන්න.

## නිවාස

හාවුන් ඇති කිරීම සඳහා වැඩි උෂ්ණත්වයක් නොමැති සිසිල් ස්ථාන තෝරාගත යුතුය. පොකුණු හෝ අන් ජලාශ ආශ්‍රිත ස්ථාන යෝග්‍ය වේ,

කූඩු සඳහා අවශ්‍ය ඉඩකඩ (අඟල් වලින්)

| | දිග | පළල | උස |
|---|---|---|---|
| තනි හාවුන් | 30'' | 30'' | 24'' |
| හාවියන හා පැටව් | 48-72'' | 30'' | 24'' |
| හා පැටව් 20 | 144-182'' | 30'' | 24'' |

හාවුන් මාස 5-6 පමණ වන විට පට්ටිදැමීම සඳහා යෝග්‍යය. මේ වන විට හාවිය රාත්තල් 7 පමණ විය යුතුය. පට්ටිදැමීම සඳහා හාවියන් 10 දෙනෙකුට එක හාවෙකු සෑහේ. වැඩි පැටව් ගණනක් බෝකිරීම සඳහා හාවිය සමඟ දිනක් පමණ එක්ව සිටීමට සලස්වන්න.

හාවෙකු සති 8 ක් පමණ වයස්වූ විට මස් රාත්තල් 4 ක් පමණ සපයති. හාවුන් ඝාතනයට පැය 6 කට ප්‍රථම ආහාර දීම නැවැත්විය යුතුය නමුත් ජලය සැපයීම නොකඩවාම කළ යුතුය.

## රෝග

පැටවුන් ගබ්සා කිරීම හා උපතේදී පැටව් මැරී සිටීම නිෂ්පාදනය දුර්වල වීම සඳහා බලපාන එක් කරුණක් වේ. මෙසේ සිදුවන්නේ ගැබ්බර හාවුන් අපරීක්ෂාවෙන් අල්ලා ඉසසීම, අමුත්තන් දැකීමෙන් කලබලවීම, ප්‍රසූත කරන අවස්ථා වලදී කලබලවීම ආදීන් නිසාය. තවද ලිස්ටීරියෝසිස් සහ සැල්මොනෙල්ලෝසිස් නමැති රෝගද, එම ලක්ෂණ ඇති කරයි.

සුදුසු පාලනය සහ පිරිසිදුකම මගින් මෙම අජීවී ප්‍රසූත අඩුකර ගත හැක. පලමු සතිය තුලදී අධික ශීතල, දුර්වල පැටව් ඇතිවිට පැටව් කිරි නොබීම සහ මවට කිරි නොමැතිවීම යනාදී හේතූන් ඇති වුවහොත් පැටවු මිය යා හැක. ක්‍රමවත් පාලනයකින් මේ මරණ සංඛ්‍යාව අඩුකර ගත හැක.

ඔබේ හා පට්ටියේ සතෙකුගේ රෝගී ලක්ෂණයක් දුටුවහොත් වහාම පශු වෛද්‍ය නිලධාරී හමුවී උපදෙස් බලා ගත යුතුය.